දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011- 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info @psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APP/6/836/2019
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.02. 28

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 01/2022

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම.</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවන් පදනම් කර ගනිමින් එම සේවාවන්හි විශේෂ ශ්‍රේණිය සඳහා උසස්වීම් ලබා දීම සිදු කරනු ලැබේ. එලෙස විශේෂ ශ්‍රේණිය සඳහා උසස්වීම් ලද නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීමෙන් අනතුරුව එම තනතුරුවල රාජකාරි භාර ගැනීම සඳහා යොමු කිරීමේ දී ඔවුන් හට එම තනතුරුවල රාජකාරි භාර නොදී ආපසු හරවා යැවීමේ සිදුවීම් කිපයක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති බලය මත මෙම කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ නොසලකා කටයුතු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 ඇ (1) ව්‍යවස්ථාව අනුව ක්‍රියා කළයුතු වරදක් ලෙස සැලකිය හැකි බව මෙම කොමිෂන් සභාව අදහස් කර සිටී.

02. විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් එම ශ්‍රේණියට අදාළ තනතුරුවල රාජකාරියට වාර්තා කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2021 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි. එකී චක්‍රලේඛ විධිවිධාන අනුව විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලබන නිලධාරියෙකු විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබීමෙන් පසුව එම පත්වීම් ලිපිය ලද දින සිට සති දෙකක (02) කාලයක් තුළ නව තනතුරෙහි රාජකාරි භාර ගැනීමට කටයුතු නොකළහොත් එම නිලධාරියාගේ විශේෂ ශ්‍රේණියේ උසස්වීම අවලංගු කරනු ඇත. එම විධිවිධාන තදින් ම ක්‍රියාත්මක වෙමින් පවතින මෙවන් අවස්ථාවක, නව තනතුරේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි නිලධාරීන් ඔබ ආයතනවලින් නිදහස් කිරීමට කටයුතු කිරීම මෙන් ම පුරප්පාඩුව පවතින තනතුරුවල රාජකාරි සඳහා වාර්තා කරන විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ට අදාළ තනතුරේ රාජකාරී භාර දීම ද ආයතන ප්‍රධානීන් වශයෙන් ඔබගේ වගකීමක් බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

03. තවද විශේෂ ශ්‍රේණියේ නොවන නිලධාරීන් විශේෂ ශ්‍රේණියට අනුමත තනතුරුවල සේවයේ යෙදවීමෙන් විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් පමණක් නොව පත්කිරීම් බලධාරීන් හා පරිපාලන බලධාරීන් ද නොයෙකුත් ගැටළුවලට මුහුණ පා ඇති බව නිරීක්ෂණය වී ඇත. විශේෂ ශ්‍රේණියට අනුමත තනතුරුවල කාර්යභාරය විශේෂ ශ්‍රේණියේ නොවන නිලධාරීන් ලවා ඉටු කරවා ගැනීමට හැකියාවක් පවතී නම්, එම තනතුරු විශේෂ ශ්‍රේණියේ නොවන තනතුරු ලෙස සැලකිය

04. මෙම තත්ත්වය දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ උසස් කිරීමේ හා තනතුරුවලට පත්කිරීමේ ක්‍රියාවලියට දැඩි අහිතකර බලපෑමක් වී ඇති හෙයින් ඔබගේ පෞද්ගලික අවධානය මේ කෙරෙහි යොමුකර විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත් කර ඔබ ආයතනය වෙත වාර්තා කරන නිලධාරීන් එම තනතුරුවලට පත් කිරීමට කටයුතු කරන ලෙසත් විශේෂ ශ්‍රේණියට උසස්වීමක් ලද නිලධාරියෙකුට අදාළ තනතුරේ රාජකාරියට වාර්තා කිරීමට හැකිවන පරිදි නොපමාව එම නිලධාරියා මුදා හැරීමට කටයුතු කරන ලෙසත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණික ව දන්වා සිටිමි.

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව